## Our True ID in Christ 4- Sam J. 9th June 19

**ක්‍රිස්තුස්වහන්සේ තුළ අපේ සැබෑ අනන්‍යතාවය (4)**

අපව මව්කුසයේ පිළිසිඳගන්නටත් පෙර උන්වහන්සේ අප ගැන දැනසිටීමෙන් සහ පුදුමාකාර ලෙසත් සංකීර්ණ ලෙසත් සාදා තිබීමෙන් සහ අප ජීවත් වෙන්නට පටන් ගන්නටත් පෙර අපේ ජීවිතයේ සෑම දවසක්ම උන්වහන්සේ දැනසිටීමෙන් දෙවියන්වහන්සේට අපව කොපමණ වැදගත් වෙනවාද කියා ගීතාවලිය 139:13-16 තුළින් පසුගිය සතියේ අපි බැලුවෙමු.

**අප දෙවියන්වහන්සේගේ ප්‍රධානම** නිමැවුමයි. *එපීස 2:10 මක්නිසාද අපි වනාහි යහපත් ක්‍රියා කරන පිණිස ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ මවනු ලැබ දෙවියන්වහන්සේගේ කර්මාන්තයව සිටින්නෙමු. ඒ යහපත් ක්‍රියාවල අප හැසිරෙන (අනික් අයට උපකාර කරන්නට ජීවිතය ගතකරන) පිණිස දෙවියන්වහන්සේ ඒවා බොහෝ කාලයකට පෙර සූදානම් කළසේක.*

අප දෙවියන්වහන්සේගේ ප්‍රධානම නිමැවුම වෙන්නේ උන්වහන්සේ අපව සෑදුව නිසාය. පටන්ගැනීමේ කාලයේදීම උන්වහන්සේගේ ස්වරූපයෙන් අපව සාදා උන්වහන්සේගේ ජීවනයේ හුස්ම අපට දුන් බැවින් අද අපි යේසුස්වහන්සේට අයත්ව සිටිමුව. අප දෙවියන්වහන්සේගේ කැබිනට්ටුවේ අලංකාරයට තබා තිබෙන ප්‍රධානම නිමැයුමයි. අපව අලංකාර ලෙස පෙන්වන්නට දෙවියන්වහන්සේ ඉතා කැමතියි. උන්වහන්සේගේ අනර්ඝ, වටිනා, තෝරාගත්, ප්‍රධානම නිමැවුම ලෙස අපව පෙන්වන්නට දෙවියන්වහන්සේ කැමැතිවනසේක. ඒ ගැන සිතන්න! ප්‍රධානම කර්මාන්තය-කැපීපෙනෙන කලා කෘතියක්, නිපුනතාවයක්, නැතහොත් අත් වැඩක් ! ආහ් ඒ ඔබයි. ඔබේ ළඟ සිටින කෙනාට ඒක කියන්න. ඔබ නිකම් බාල, ලිස්සා යන, කාණුවක ජීවත්වන අයාලේ යන්නෙක් නොවේ. නැත! ඔබ දක්ෂ කර්මාන්ත කරුවෙකුගේ කැපී පෙනෙන කලාකෘතියකි. කිසිවිටෙක ඔබ ගැන සුලුකර නොසිතන්න. ක්‍රිස්තුස්වහන්සේ තුළ සැබවින්ම ඔබ කවුද කියා ඔබේ කටින් ප්‍රකාශ කරන්නට හැකිවෙන පිණිස ඔබේ සිතුවිලි සහ සිත එක්තැන් කරගැනීම සඳහා ඔබේ මනස පුහුණු කරගන්නට ඉගෙනගන්න.

ක්‍රිස්තුස්වහන්සේ තුළ සෑම ආත්මික ආශීර්වාදයකින්ම අප ආශීර්වාද කරනු ලැබ සිටින්නෙමු. *එපීස 1:3-4 අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පියවූ දෙවියන්වහන්සේට ප්‍රශංසා වේවා. අප යේසුස්වහන්සේට අයත්ව සිටින බැවින් ස්වර්ගීය ස්ථානවල සියලුම ආශීර්වාදවලින් උන්වහන්සේ අපට ආශීර්වාද කළසේක.* වෙන කිසිම දෙයක් නිසා නොව ඔබ යේසුස්වහන්සේට අයිතිව සිටින නිසාමය. යේසුස්වහන්සේ නිසාමය.

එබැවින් මේ ආශීර්වාද උපයා ගැනීමට හෝ මිලදී ගත නොහැකි බව අපි දනිමු. මක්නිසාද යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔවුන්ගේ ස්වාමින්වහන්සේ ලෙස ප්‍රකාශකර, ඔවුන්ගේ ජීවිතවලට පිළිගත් සෑම කෙනෙකුටම ඒවා ලැබෙන බැවිනි. ඔබ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින විට මේ සෑම ආත්මික ආශීර්වාදයක්ම ඔබට තිබේ. මේ ආශීර්වාද මොනවාද? ඒවා අපට කරන්නේ මොනවාද?

එපීස 1:3 හි ආශීර්වාදය යන වචනය ග්‍රීක් බසින් "ඉයුලොජි" යනුයි. එහි අර්ථය නම් "යමක් ගැන යහපත් යැයි කතා කිරීම"යනුයි. මෙහි දෙවියන්වහන්සේ කතා කරන බැවින් දෙවියන්වහන්සේ අපි ගැන යහපත කතා කර තිබෙනවා නැතහොත් අපගේ ප්‍රතිලාභය උදෙසා යහපත් දේවල් ප්‍රකාශකර තිබෙනවා යැයි අපට කිව හැක.

එසේනම් මේ යහපත් දේවල් මොනවාද? එපීස 1:4-13 බලන්න. මේවායින් සමහර දේවල් එහි සඳහන් වේ.

4 වන පදය: **අපි උන්වහන්සේගේම වන පිණිස දෙවියන්වහන්සේ අපව තෝරාගත්සේක.** ලෝකය මැවීමටත් පෙර දෙවියන්වහන්සේ අපට ප්‍රේමකොට උන්වහන්සේගේ ඇස් ඉදිරියේ ශුද්ධව සහ වරදක් නැතුව සිටින පිණිස ක්‍රිස්තුස්වහන්සේ තුළින් අපව තෝරා ගත්සේක.

උන්වහන්සේගේ ප්‍රේමය, උන්වහන්සේගේ යහපත් සතුට සහ උන්වහන්සේගේ අනුග්‍රහය නිසා **අපව**

**ශුද්ධව සහ නිර්දෝෂව සාදන පිණිස දෙවියන්වහන්සේ අපව තෝරා ගත්සේක.** (පද 5-6)එය දෙවියන්වහන්සේගේ තේරීම විය. ඔබ දෙවියන්වහන්සේගේ තේරීමයි! උන්වහන්සේ ඔබව තෝරාගත්සේක. ඔව්! එය නිවැරදියි. එය අප තුළට කිඳා බසින්නට හරිමු.

ලෝකය මැවීමටත් පෙර දෙවියන්වහන්සේ අපව තෝරාගෙන, අපේ පාපවල අප මැරී සිටියදී අපේ පාප වෙනුවෙන් මියගොස් උන්වහන්සේ තුළ අපව ජීවත්වන්නට සැලැස්වීම කොපමණ ආශීර්වාදයක්ද. උන්වහන්සේගේ අනුග්‍රහය අප කෙරෙහි යොමු කොට අපට ගැලවීම පිලිගැන්වීමට උන්වහන්සේ තෝරාගත්සේක. උන්වහන්සේගේ අනුග්‍රහයෙන් ගැලවීම පැමිණෙන බව බයිබලය අපට කියයි. එය උපයා ගත නොහැක. එය අපට දෙන ලදී. පාපය ලෝකයට ඇතුල්වීමටත් පෙර උන්වහන්සේ මෙම තීරණය ගත් බව අපට දැන ගන්නට ලැබෙන විට එය තවත් අපව පුදුම කරවයි. හාලේලූයා! යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔබ උදෙසා කර තිබෙන දෙය ගැන ඔබට දැඩි උනන්දුවක් ඇතිවෙන්නේ නැද්ද.

ඊළඟ ආශීර්වාදය (5වන පදය) **අපව උන්වහන්සේගේ දරුකමට ගැනීම.** දෙවියන්වහන්සේ අපව තෝරා ගත්තේ ශුද්ධව සිටින්නට සැලැස්වීමට පමණක් නොව, ඒ තුළ අඩංගුවන සියලුම ප්‍රතිලාභ සමග උන්වහන්සේ ගේ දරුවන් ලෙස සම්පූර්ණ තත්වය අපට ලබා දෙනසේක. *යොහන් 1:12 "යම් පමණ දෙනෙක් උන්වහන්සේ පිළිගත්තෝද, එනම් උන්වහන්සේගේ නාමය කෙරෙහි අදහාගන්නෝද ඔවුන්ට දෙවියන්වහන්සේගේ දරුවන් වෙන්ට උන්වහන්සේ බලය දුන්සේක."*

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචිය කෙරෙහි විශ්වාස කිරීම සහ යේසුස්වහන්සේ අපගේ ජීවිතවලට පිලිගැනීම දෙවියන්වහන්සේගේ පුත්‍රයෙක් හෝ දියණියක් වීමේ සුදුසු තත්වය අපට ලබා දෙයි. එය අපට අපගේ ස්වර්ගීය පියාණන්වහන්සේගේ සහ උන්වහන්සේගේ රාජ්‍යයේ සියලුම උරුමයන් සහ වරප්‍රසාද ලබා දෙයි.

6 වන පදය **අප පිලිගනු ලැබ/ප්‍රේමවන්තයානන් තුළට අයත්ව සිටින බව කියයි.** අපි ක්‍රිස්තුස්වහන්සේ පැළඳගත් විට දෙවියන්වහන්සේ අප දෙස බලද්දී උන්වහන්සේට පෙනෙන්නේ ක්‍රිස්තුස්වහන්සේගේ අලංකාරයයි. ක්‍රිස්තුස්වහන්සේගේ ලේවලින් අපගේ පාපවල වරදකාර බව අපගෙන් ඉවත්කර ඇති බැවින් පියාණන්වහන්සේ ඉදිරියේ අපි අංගසම්පූර්ණව පිලිගත් ආකාරයට සිටගන්නෙමු.

අපගේ ස්වාමිවූ ක්‍රිස්තුස්වහන්සේ තුළ අප වරදට පත් කිරීමක් නැතුව, පිළිගනු ලැබූවන්ව සිටින විට දෙවියන්වහන්සේ අප ගැන සතුටුවනසේක. එසේනම් ක්‍රිස්තුස්වහන්සේ තුළ දැන් ඔබේ අනන්‍යතාවය කුමක්ද? දෙවියන්වහන්සේගේ පුතා, දෙවියන්වහන්සේගේ දුව.

**උන්වහන්සේගේ ලේවලින් අපි මුදනු ලැබුවෙමු.** (7 වන පදය) උන්වහන්සේගේ ලේ පූජාවෙන් ක්‍රිස්තුස්වහන්සේ තුළ අප නිදහස් කරනු ලැබ සිටින්නෙමු. දෙවියන්වහන්සේ ගේ මහත් අනුග්‍රහය නිසා අපට පාපයට සමාව තිබේ. මිදීම යනුවෙන් කෙනෙකුගේ නිදහස මිලදී ගැනීම, වන්දියක් /කප්පම් මුදලක් ගෙවීම ගැන කතා කරයි. අපගේ පාපවල මිලය, සදාකාල වරදකාරකමෙන් අපව ඉවත්කර මිලට ගැනීමට කරන ගෙවීම, ක්‍රිස්තුස්වහන්සේගේ ලේවලින් මුලුමනින්ම ගෙවන ලදී. ක්‍රිස්තුස්වහන්සේ තුළ අප තව දුරටත් පාපයට වහලුන් නොවන්නෙමු. එහෙත් අපි දෙවියන්වහන්සේගේ වහලුන් බවට පත්වන්නෙමු. එබැවින් මිලයක් ගෙවා මිලට ගෙන ඇති බැවින් උන්වහන්සේට අයිති අපගේ ශරීරයෙන් සහ අපගේ ආත්මයෙන් දෙවියන්වහන්සේ මහිමයට පමුණුවන්නැයි බයිබලය අපට කියයි. (1 කොරින්ති 6:20)

**අපට පාපවලට සමාව තිබේ.** එය මිදීමට ඉතා සමීපව සම්බන්ධ වෙයි. නමුත් කාසියේ අනෙක් පැත්ත බලන්න. අපේ පාපවලට කප්පම ( බලාත්කාරයෙන් අල්ලා රඳවාගෙන සිටින කෙනෙක් නිදහස්කර යැවීම සඳහා දැඩි අවධාරණයෙන් ඉල්ලා සිටින මුදල් ප්‍රමාණය) ගෙවීමේදී, පාපයේ ණය අවලංගු කරන ලද බැවින් අපට සමාව දෙන ලදී. දෙවියන්වහන්සේගේ ශුද්ධවූ ව්‍යවස්ථාව කඩකිරීම ගැන වරදකරුවන් වන බර අපි තව දුරටත් නොදරන්නෙමු.

ඊළඟ ආශීර්වාදය **උන්වහන්සේගේ කැමැත්තේ රහස දැනගැනීමයි** (8 වන පදය). දැන් අපි සියල්ලම

නොදන්නා නමුත් එක් දවසක යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ සැඟවී තිබෙන රහස අපි අවබෝධ කරගන්නවා ඇත. නමුත් 9-11 පද කියන ආකාරයට දැනට සමහර දේවල් තේරුම් ගැනීමට සෑහෙන පමණට ප්‍රඥාව සහ ඉදිරි දැක්මක් දෙවියන්වහන්සේ අපට දී තිබේ. උන්වහන්සේගේම යහපත් සැලැස්ම ඉටුකිරීමේ ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳ අභිරහස් කැමැත්ත, දෙවියන්වහන්සේ දැන් අපට එළිදරව්කර තිබේ. 9 සැලැස්ම මෙයයි: *කාලවල සම්පූර්ණකමේ නියමය ලෙස ස්වර්ගයෙහි දේවල්ද පොළොවෙහි දේවල්ද යන සියල්ල ක්‍රිස්තුස්වහන්සේ තුළ එක්රැස් කරන්නට, තමන්වහන්සේ තුළ අදහස් කළ තමන්ගේ ප්‍රසන්නකමේ හැටියට තමන්ගේ කැමැත්තේ රහස අපට දන්වා දීමෙන්ය.*

දැන් අපට කරන්නට තිබෙන එකම දේ නම් අපේ ජීවිත ගැන තිබෙන උන්වහන්සේගේ සර්වසම්පූර්ණ සැලැස්මට අනුව අපව තබා ගැනීමයි. මගේ ජීවිතයේ ඔබගේ රාජ්‍යය ඒවා, ඔබගේ කැමැත්ත කරනු ලැබේවා.

ඊළඟ පොරොන්දුවූ ආශීර්වාදය නම් **ක්‍රිස්තුස්වහන්සේ තුළ අපට දෙන ලද උරුමයයි.** *(11 වන පදය) තමන්ගේ කැමැත්තේ සැලැස්මේ හැටියට සියල්ල සිද්ධකරන්නාවූ තැනැන්වහන්සේගේ නියමයේ හැටියට අපි පෙර නියම කරනු ලැබ ක්‍රිස්තුස්වහන්සේ තුළ උරුමයක් වී සිටිමුව.* ඒ උරුමයට අයත්වන්නේ මොනවාද? *1 කොරින්ති 2:9 නුමුත් ලියා තිබෙන ලෙස: දෙවියන්වහන්සේ විසින් තමන් ප්‍රේම කරන්නන්ට සූදානම් කළ යම් දෙයක් ඇද්ද ඒ දේ ඇසට නොපෙනුනේය; කනට නොඇසුණේය, මනුෂ්‍යයාගේ සිතට නොපැමිණුනේය."*

මහිමයේ පොහොසත්කම්, දෙවියන්වහන්සේගේ අභිමුඛය, සදාකාල නිවස --- දැන් තිබෙන මේ දේවල් අපේ උරුමයට අයත් සියලුම ආශීර්වාදවල මතුපිට සීරීමක තරමටවත් නොසෑහේ. තවත් කිව හැකි තරම් බොහෝ දේවල් මට තිබේ.

ප්‍රශ්නය: ක්‍රිස්තුස්වහන්සේ තුළ ඔබ කවුද කියා ඔබ දන්නවාද? ඔබට නොමිලේ ලබා දී තිබෙන්නාවූ ඔබේ සැබෑ අනන්‍යතාවය ඔබට දැකිය හැකිද?

ඔබේ අනන්‍යතාවය කෙලෙසීමට සහ සොරකම් කිරීමට සොයන සතුරාගේ බොරුවලට ඇහුම්කන් නොදී දෙවියන්වහන්සේ දෙන ලද ඔබේ අනන්‍යතාවයට අනුකූලව ජීවත්වීම ඔබේ වගකීම වේ. ඔබේ අනන්‍යතාවය පවතින්නේ යේසුස්වහන්සේගේ ලේ තුළ නිසා කිසිම යකෙකුට එයට ළංවීමට නොහැක!!